නිපුණතාව 4.0 - මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 4.10 - ගනුදෙනු වාර්තා කිරීමේදී සිදුවන වැරදි නිවැරදි කරයි.

ගනුදෙනු වාර්තා කිරීමේදී සිදුවන වැරදි ප්‍රධාන ක්ෂේත්‍ර දෙකකට වර්ග කළ හැකිය.

1.ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන (සමානතාවට බලනොපාන) වැරදි
2.ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන (සමානතාවට බලපාන) වැරදි

- ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි සිදුවන අවස්ථාවකදී ශේෂ පිරික්සුම තුලනය වේ.

**<u>ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි</u>**

1.කිසියම් ගනුදෙනුවකට අදාළ මූලාශ්‍ර ලේඛනය සටහන් කිරීම අත්හැරීම.
2.ප්‍රධාන ගිණුම්කරණ මූලධර්මවලට පටහැනිව ගනුදෙනු වාර්තා කිරීම.
3.යම් ගනුදෙනුවක වටිනාකම ගිණුම්වල වැඩියෙන් හෝ අඩුවෙන් සටහන් වීම.
4.යම් ගනුදෙනුවක් වාර්තා කිරීමේදී සිදු වූ වරදක් තවත් වරදක් මගින් හිලව් වීම.
5.ගනුදෙනුවකට අදාළ ද්විත්ව සටහන ගිණුම්වල දෙවරක් සටහන් වීම.

පහත සඳහන් වන්නේ මුදිතගේ ව්‍යාපාරයේ 2020/03/31න් අවසන් වසරේ ගිණුම් තැබීමේදී සිදු වූ දෝෂ වේ.
1.රු.30,000ක අශාන්ට ණයට විකුණුම් ඉන්වොයිසියක් පොත්වලින් මග හැරීම.
2.රු.12,000ක ගොඩනැගිලි අලුත්වැඩියාවක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම.
3.රු.2,000ක විදුලිය වියදම දෙවරක් මූලික පොත්වල සටහන් වීම.
4.රු.18,000කට පසිඳුගෙන් ණයට ගත් බඩු තොගය,ගැනුම් ජර්නලයේ රු.8,100ක් ලෙස සටහන් කිරීම.
5.රු.4,000ක අත්පිට විකුණුම්,මුදල් ලැබීම් ජර්නලයේ නිවැරදිව සටහන් කර විකුණුම් ගිණුමට පිටපත් කර නැති අතර රු.24,000ක් රවිඳුට ගෙවීම මුදල් ගෙවීම් ජර්නලයේ නිවැරදිව වාර්තා කර,රවිඳුගේ ගිණුමේ රු.20,000ක් ලෙස හර කිරීම.

අවශ්‍ය වන්නේ,
1.ඉහත එක් එක් දෝෂය නිවැරදි කිරීමේ ජර්නල් සටහන දැක්වීම.
2.මුදිතගේ ව්‍යාපාරයේ 2020/03/31න් අවසන් වසරේ කෙටුම්පත් ශුද්ධ ලාභය රු.128,000ක් නම්,ශුද්ධ ලාභය නිවැරදි කිරීමේ ලේඛනයක් පිළියෙල කිරීම.